# බළන්ගොඩ නගර සභාව

## 2018-11-08 දිනැති මහා සභා වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2018.11.08**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | අකිල එල්ලාවළ මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | ර්. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රි | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රි | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 17. ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්.එච්.ඒ.කරුණාරත්න මිය |

**01. පසුගිය සභාවේ සභා වාර්තාව සම්මත කිරීම**

ගරු සභාපතිතුමන් විසින් සභාවේ කටයුතු පෙ.ව.10.10 ට පමණ ආරම්භ කල අවස්ථාවේ,ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් අභ්‍යවප්‍රාප්ත බලංගොඩ නගර සභාවේ හිටපු සභාපති විමලසේන වැවේගෙදර මැතිතුමන් සිහිකර එතුමාට ගෞරවයක් වශයෙන් ගරු සභාව විනාඩියක නිශ්ශබ්දතාවයකින් සිටීම සුදුසු බව යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදි ගරු සභාවේ සිටි සියළුදෙනා බලංගොඩ නගර සභාවේ හිටපු සභාපති විමලසේන වැවේගෙදර මැතිතුමන් සිහි කර විනාඩියක නිශ්ශබ්දතාවයක් ආරක්ෂා කරන ලදී.

ඉන් අනතුරුව පසුගිය සභාවේ සභා වාර්තාව එනම් 2018.10.11 දිනැති මහ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට යෝජනා කල අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් සභා වාර්තාවේ සංශෝධනයන් තිබේද යන්න විමසා සිටිමේදි ඒ සඳහා කරුණු ඉදිරිපත් කල ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් තමන් පසුගිය වකවානුවේ අවුරුදු 15 ක් සභාපතිවරයෙක් ලෙසත් අවුරුදු 8ක් නාගරික මන්ත්‍රීවරයෙක් ලෙසත් ක්‍රියාකර තිබුනද ඒ කිසිවිටෙක පසුගිය සභාවේ මෙන් අශෝබනකාරී සිද්ධියක් ඇති නොවූ බවත් සභාපතිවරයෙක් ලෙස එවන් තත්වයන් පාලනය කර ගැනීමට වගබලා ගතයුතු බවත් පවසා සිටි අතර සභාපතිතුමන් විසින් තම කථා කරගෙන යාමේදි එයට බාධා කිරීම නිසා මෙම තත්වය ඇතිවූ බවත් එදින එම සිදුවීම වීමට පොරුතුව ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලද කරුණු වාර්තාවේ සඳහන් නොවීම නිසා සභා වාර්තාව අසත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන බවද පවසා සිටින ලදී.එමෙන්ම තමාට එරෙහිව සභාගත කර ඇති නිළධාරින්ට තර්ජනය කිරීම් හා මානසික පීඩාවන්ට ලක්කිරීම් ආදි ලිපිවල පිටපත් පොලිසියට භාරදෙන ලෙස පවසා සිටීමේදි ඊට පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් එම ලිපි සියල්ල මේවන විටත් පොලිසියට භාරදී ඇති බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් එදින සභාවෙන් ප.ව.12.40 ට පමණ පිටව ගිය අතර එය සභාවාර්තාවේ අඩංගු නොවීම පිදිබඳව පවසා සිටි අතර එය මෙම වාර්තාවේ සංශෝධන ලෙස සටහන් කරන ලදී.

මෙහිදී සභා වාර්තාව පිළිබඳව තොරතුරු විමසා සිටි ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින් යම් යෝජනා විවේචනය කරමින් අදහස් ඉදිරිපත් කලද එම යෝජනා අවසානයේ විරෝධතා නොමැතිව ඒකමතිකව සම්මත වුනා යන්නෙන් සඳහන් කිරීම පිළිබඳවත්, සභා වාර්තාවේ එදින සාකච්ඡා කරන සියල්ල අන්තර්ගත යුතුයි යන්නෙන් ක්‍රමවේදයක් තිබේදැයි යන්න විමසා සිටි අවස්ථාවේ එයට පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් යම් යෝජනාවක් සඳහා බෙදීමක් ඉල්ලා ඡන්දයක් නොතිබූ විටෙක එම යෝජනා සභාගත වන ක්‍රමවේදය වනුයේ විරෝධතා නොමැතිව ඒකමතිකව සම්මත වුනා යනුවෙන් බවත් සභාවේ කථාකරන සියල්ල වාර්තාවට අඩංගු නොවන අතර සංක්ෂිප්තයක් පමණක් වාර්තාවට අඩංගු කරන බවත් පවසා සිටින ලදී. වැඩි දුරටත් අදහස් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් සභාවේ කාලය කළමණාකරනය කර ගනිමින් සභාව පවත්වාගෙන යාම ඉතා වැදගත් බවද පවසා සිටින ලදී.
ඉහතින් දක්වා ඇති අදහස් අවසානයේ ගරු සභාපතිතුමන් විසින් 2018.10.11 දිනැති සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලදුව වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන**

- ගරු සභාපතිතුමන් තම නිවේදන ආරම්භ කරමින් තම පියාණන්ගේ අභාවය වෙනුවෙන් ශෝකය පල කරන ලද හා එතුමාට සභා ගර්භය තුල අවසන් ගෞරව දක්වමින් එම කටයුතු සංවිධානය කරමින් දක්වූ සහයෝගය සඳහා ගරු සභාවේ උප සභාපතිතුමන් ඇතුළු සියළු මන්ත්‍රීවරුන්ටත්,නගර සභා කාර්යය මණ්ඩලය හා සේවක මණ්ඩලයට ස්තූතිවන්ත වන බව පවසා සිටින ලදී.

- ගරු නාගරික මන්ත්‍රීනි තරංගනී සමරසේකර මැතිතුමියගේ පියාගේ අභාවය වෙනුවෙන්,ගරු සභාවේ සියළුම මන්ත්‍රීවරුන් වෙනුවෙන් හා නගර සභා කාර්යය මණ්ඩලය

හා සේවක මණ්ඩලය වෙනුවෙන් එතුමියට ශෝකය පල කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පවසා සිටින ලදී.

● ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන අතරින් ගිණුම් තැබීම හා වාර්ෂික වාර්තා පිළියෙල කිරීම වෙනුවෙන් බලංගොඩ නගර සභාව ප්‍රථම ස්ථානයට ගෙන ඒම වෙනුවෙන් කැපවී ක්‍රියාකල බලංගොඩ නගර සභාවේ ගණකාධිකාරිතුමා හා ඒ හා සම්බන්ධ වූ නිළධාරින්ට සුභාශිංෂන පිරිනමන බව පවසා සිටි ගරු සභාපතිතුමන් ප්‍රශංසාත්මක ලිපි මගින් එම දක්ෂ නිළධාරීන් ඇගයීම සිදු කරන බව පවසා සිටින ලදී.

● එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් පැවසූ පරිදි සභා රැස්වීම තුළ ගත කරන කාලය අර්ථාන්විතව කාලය කළමණාකරනය කර ගනිමින් ගත කිරීමට සියළු සභික මහත්ම මහත්මීන් කටයුතු කිරීම ඉතා වැදගත් බව පවසා සිටින ලදී.

**03. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා/ටෙන්ඩර් ඉදිරිපත් කිරීම**

**මෙදින**

● 2019 වර්ෂයේ බස් නැවතුම්පල පොදු වැසිකිලි හා මහජන පොළ පොදු වැසිකිළි සේවය පවත්වාගෙන යාම සඳහා ප්‍රසිද්ධ ලංසුපත් කැඳවීම

● බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරය සඳහා ප්‍රසිද්ධ ලංසුපත් කැඳවීම

● පොදු වෙළඳසැල අංක 12 කඩ කාමරය සඳහා ප්‍රසිද්ධ ලංසුපත් කැඳවීම

යනාදි ටෙන්ඩර් පත් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමන්ගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරන ලදී. ටෙන්ඩර් පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමන්ගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු සභාවක් බවට පත්කරන ලදී.

**ඉන් අනතුරුව ගරු සභාපතිතුමන් විසින් ටෙන්ඩර් මණ්ඩල තීරණ පිළිබඳව ගරු සභාවේ සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපති චමික ජයමිණි විමළසේන මැතිතුමන් විසින් ගෙනෙන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.**

●2019 වර්ෂයේ බස් නැවතුම්පල පොදු වැසිකිලි හා මහජන පොළ පොදු වැසිකිළි සේවය පවත්වාගෙන යාම සඳහා ප්‍රසිද්ධ ලංසුපත් කැඳවීමේදී අවම ලංසු මුදල වන රු.85,250.00 ලංසු

මුදල ඉදිරිපත් කරන ලද රුවන් කුට්ටියලාගේ ජයතිස්ස යන අයට ලබාදීමට සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනුලැබූ තීරණය සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ගෙනෙන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

- බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරය සඳහා ප්‍රසිද්ධ ලංසුපත් කැඳවීමේදි එකඳු ලංසුපතක්වත් නිකුත් නොවූ බව ටෙන්ඩර් මණ්ඩලය විසින් ගරු සභාවට වාර්තා කර තිබූ අතර මේ පිළිබඳව ගරු සභාවේ දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී. අනතුරුව පෙර පැවති අවම ලංසු මුදල වන රු.147,600 ක මුදලින් 20% ක් අඩුකර අවම ලංසු මුදල රු.118,080 සේ සලකා නැවත ප්‍රසිද්ධ ලංසුපත් කැඳවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

- පොදු වෙළඳසැල අංක 12 ක කාමරය සඳහා ප්‍රසිද්ධ ලංසුපත් කැඳවීමේදි එකඳු ලංසුපතක්වත් නිකුත් නොවූ බව ටෙන්ඩර් ගරු සභාවේ දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී.අනතුරුව පෙර පැවති අවම ලංසු මුදල වන රු.5000.00 මුදල රු.3000.00 දක්වා අඩුකර නැවත ප්‍රසිද්ධ ලංසුපත් කැඳවීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 04. කල් දී ඇති යෝජනා

### *04:02 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා*

**04:02:01 මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයේ බස් නැවතුම්පළ තක්සේරුවට අයත් නොවූ කඩකාමර හතරක් සහ කාර්යාල වශයෙන් පවතින කඩකාමරයක ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීම.**

මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයේ බස් නැවතුම්පළ තක්සේරුවට අයත් නොවූ කඩකාමර හතරක් සහ කාර්යාල වශයෙන් පවතින කඩකාමරයක ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව සභාවේ විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:02** **මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට පොදු වෙළඳසැල්, මස් හා මාලු කඩ ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීම.**

මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට පොදු වෙළඳසැල්, මස් හා මාලු කඩ ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව සභාවේ විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

04:02:03 **මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට මැණික් කඩ කාමරවල ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීම**

මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට මැණික් කඩ කාමරවල ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව සභාවේ විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:04** **මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට පදික කඩ කාමරවල ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීම**

මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට පදික කඩ කාමරවල ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව සභාවේ විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:05** **මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට පොදු වෙළඳසැල කඩ කාමරවල ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීම.**

මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට පොදු වෙළඳසැල කඩ කාමරවල ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව සභාවේ විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:06** **මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට රථවාහන නැවතුම් ගාස්තු හා පෞද්ගලික බස්ගාල් ගාස්තු ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීම**

මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට රථවාහන නැවතුම් ගාස්තු හා පෞද්ගලික බස්ගාල් ගාස්තු ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව සභාවේ විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:07** **මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට මහජන පොළ ආපනශාලාව ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීම**

මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට මහජන පොළ ආපනශාලාව ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව සභාවේ විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:08** **මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට මහජන පොළ කඩකාමර ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීම**

මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට මහජන පොළ කඩකාමර ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව සභාවේ විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02ඃ09 මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට පොළ කඩකාමර ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීම**

මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට පොළ කඩකාමර ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව සභාවේ විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02ඃ10 මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට ඉම්පීරියල් ඉදිරිපිට කඩකාමර ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීම**

මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට ඉම්පීරියල් ඉදිරිපිට කඩකාමර ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර එම යේජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව සභාවේ විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

04ඃ02ඃ11 **මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට බස්නැවතුම්පොළ සහ මහජන පොළ වැසිකිළි නඩත්තු කිරීමේ ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීම**

මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට බස්නැවතුම්පොළ සහ මහජන පොළ වැසිකිළි නඩත්තු කිරීමේ ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව සභාවේ විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:12 මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට ප්ලාස්ටික් පොලිතින් ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානය බදුදීමේ ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීම**

මහා සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයට ප්ලාස්ටික් පොලිතින් ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානය බදුදීමේ ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව සභාවේ විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:13 2019 වර්ෂයට පොදුවෙළඳසැල කඩකාමර තක්සේරුව ක්‍රියාත්මක කිරීම**

2019 වර්ෂයට පොදුවෙළඳසැල කඩකාමර තක්සේරුව ක්‍රියාත්මක කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. මෙහිද ගරු සභාවේ බහුතර අදහස වූයේ දැනට **පොදුවෙළඳසැල තුළ පවතින අවම පහසුකම් යටතේ වෙළදුන්** අපහසුතා මැද වෙළදාම් කටයුතු කරන බැවින් 2019 වර්ෂයට අදාළ පොදුවෙළඳසැල කඩකාමර තක්සේරුව ක්‍රියාත්මක නොකර පැරණි මිල ගණන් යටතේම කඩකාමර ලබාදීම සුදුසු බවයි.

මෙහිදී සභාවේ ඉදිරිපත් කරන ලද සභික අදහස් සලකා බලා **2019 වර්ෂයට පොදුවෙළඳසැල කඩකාමර තක්සේරුව ක්‍රියාත්මක නොකර පැරණි** මිල ගණන් යටතේම කඩකාමර ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව සභාවේ විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:14 සම්පත්පියසට යාබද කඩකාමරයේ ගිවිසුම් කාලය ඉකුත්වීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම.**

සම්පත්පියසට යාබද කඩකාමරයේ ගිවිසුම් කාලය ඉකුත්වීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම ස්ථානය වෙළෙඳ කටයුතු අවම ස්ථානයක් බවත්, මේවන විට එහි වෙළදාම දියුණු වූවා පමණක් බැවින්, කුළී මුදල් විශාල ලෙස වැඩිකිරීම යෝග්‍ය නොවෙන බවත් පවසා සිටින ලදී.

මෙහිදී සභාවේ ඉදිරිපත් කරන ලද සභික අදහස් සලකා බලා ගරු සභාපතිතුමන් විසින් සම්පත්පියසට යාබද කඩකාමරයේ මාසික කුළිය වැට් හා එන්.බී.ටී. අඩංගුව රු.2000.00 මුදලකට කුලියට දීමට සුදුසු බවට ගෙනා යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් එය ස්ථිර කරන ලදී. විරෝධතා නොමැති හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04෴02෴15 වරිපනම් බදු වලින් නිදහස් කිරීම - එම්. ඩබ්. ජේන්නෝනා මහත්මිය**

ඇල්ලෙපොළ,මාළිගාතැන්න ප්‍රදේශයේ පදිංචි එම්. ඩබ්. ජේන්නෝනා මහත්මිය විසින් තම දිළිදු හා අසරණ බව පිළිබඳ ගරු සභාවේ අවධානය යොමුකර වරිපනම් බදුවලින් නිදහස් කරන මෙන් අදාළ වසමේ ග්‍රාම නිලධාරි හා සමෘද්ධි නිළධාරි අනුමැතිය සඳහන් ලිපියද සහිතව ඉදිරිපත් කරන ලද ඉල්ලීම් ලිපිය ඉදිරිපත් කරමින් ගරු සභාපතිතුමන් විසින් එම්. ඩබ්. ජේන්නෝනා මහත්මිය වරිපනම් බදු වලින් නිදහස් කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ අනුමැතියට යැවීමට සුදුසු බවට යෝජනා කරන ලදී.
එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04෴02෴16 සෙනසුරාදා දින ආයුර්වේදය වසා තැබීම සම්බන්ධයෙන් ඉල්ලා සිටීම .**

ආයුර්වේද වෛද්‍ය ඩබ්. බී. එස්. එස්. පුෂ්පකුමාරි මිය විසින් සෙනසුරාදා දින ආයුර්වේදය වසා තැබීම සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.
මෙහිදී ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින් අදහස් දක්වමින් සෙනසුරාදා දින නිවාඩු දිනයක් බැවින් රෝගීන් වැඩි පිරිසක් පැමිණෙන බැවින් එසේ වසාතැබීම යෝග්‍ය නොවන බව පවසා සිටින ලදී.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් අදහස් දක්වමින් පෞද්ගලික හේතු කාරණා ඇති බැවින් ආයුර්වේද වෛද්‍යතුමියට සෙනසුරාදා දින නිවාඩු අවශ්‍ය නම් ආයුර්වේද කොමසාරිස්තුමා වෙත ඉල්ලීමක් සිදුකර සෙනසුරාදා දිනයන් සඳහා වෙනත් වෛද්‍යවරයෙක් ගෙන්වා ගැනීම සුදුසු බව යෝජනා කරන ලදී.මෙහිදී ගරු සභාපතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර සෙනසුරාදා දින වල ආයුර්වේදය නොවසා ආයුර්වේද කොමසාරිස්තුමා වෙත ඉල්ලීමක් සිදුකර

සෙනසුරාදා දිනයන් සඳහා වෙනත් වෛද්‍යවරයෙක් ගෙන්වා ගැනීම සඳහා ලිපිය සකස් කිරීමට  අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන ලෙස පවසා සිටින ලදී.

විරෝධතා නොමැති හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:17 බළන්ගොඩ නගර සභාව මගින් 2015, 2016, 2017, 2018 අධ්‍යයන වර්ෂ සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන ශිෂ්‍යත්වලාභීන්ගේ නාමලේඛනය අනුමැතියට ඉදිරිපත් කිරීම**

බළන්ගොඩ නගර සභාව මගින් 2015, 2016, 2017, 2018 අධ්‍යයන වර්ෂ සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන ශිෂ්‍යත්ව ලාභීන්ගේ නාමලේඛනය ගරු සභාපතිතුමන් විසින් සභාවේ අනුමැතියට ඉදිරිපත් කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් මෙය තමන් විසින් මෙම වර්ෂයේ පැවති මංගල සභාවේදි යෝජනා  කරන ලද්දක් බවත් මෙම නාමලේඛනය සඳහා තවත් නම් ඇතුළත් කිරීමට ඇති හෙයින් ඒ සඳහා සභාවේ මන්ත්‍රීවරුන්ටද ඉඩ හසර ලබාදෙන ලෙස පවසා  සිටින ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සඳහා පිළිතුරු ලබාදෙමින්, දැනට සකසා ඇති ශිෂ්‍යත්ව ලාභීන්ගේ නාමලේඛනයේ පිටපතක් අවශ්‍ය මන්ත්‍රීවරුන්ට ලබාදෙන ලෙසත් ඔවුන් විසින් ලබාදෙන නගර සීමාව තුළ සිටින ශිෂ්‍යත්වලාභීන්ගේ නම් ද ඇතුළත් කර සකස් කරන සංශෝධිත නාම ලේඛනය අනුමැතිය සඳහා ඉදිරි සභාවකට යොමුකිරීම සුදුසු බව යෝජනා කරන ලදී.එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:18 චිත්‍රපටි ප්‍රදර්ශනය සහ ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනයට අවසර ලබාගැනීම සහ බදු මුදල් නිදහස් කිරීම - ර/ශ්‍රී බුද්ධ ජයන්ති මධ්‍ය මහා විද්‍යාලය**

ර/ශ්‍රී බුද්ධ ජයන්ති මධ්‍ය මහා විද්‍යාලය මගින් සිදුකරන ලද ඉල්ලීමකට  අනුව පාසලේ සුභ සාධන කටයුතු වෙනුවෙන් චිත්‍රපටි ප්‍රදර්ශනය සහ ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනයට අවසර ලබාගැනීම සහ බදු මුදල් නිදහස් කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සිදුකරන ලද යෝජනාව ගරු  උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:19 පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන මගින් තලංගම කුමාරගම ප්‍රාථමික විද්‍යාලය සඳහා ලීටර් 1000 ජල ටැංකියක් ලබාදීම.**

ගරු සභාපතිතුමන් විසින් තම පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන යොදවා තලංගම කුමාරගම ප්‍රාථමික විද්‍යාලය සඳහා ලීටර් 1000 ජල ටැංකියක් ලබාදීම සඳහා සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:03 ඇස්තමේන්තු අනුමත කිරීම.**

04:03:01 මුගුණමලේ සුසාන භූමි මාර්ගය කොන්ක්‍රීට් අතුරා පඩිපෙල් යොදා සංවර්ධනය කිරීම රු.760,000.00

04:03:02 දෙහිගස්තළාව දෙවෙනි පටුමග තාර යොදා සංවර්ධනය කිරීම.රු.1,000,000.00

**ගරු සභාපතිතුමන් විසින් මෙහිදී** මුගුණමලේ සුසාන භූමි මාර්ගය කොන්ක්‍රීට් අතුරා පඩිපෙල් යොදා සංවර්ධනය කිරීම රු.760,000.00 ක ඇස්තමේන්තුව හා දෙහිගස්තළාව දෙවෙනි පටුමග තාර යොදා සංවර්ධනය කිරීම.රු.1,000,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීමේ යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් එය ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් විසින් මෙම මාර්ග නගර සභාව වෙත පවරා තිබේද යන්න විමසා සිටි අතර සභා අරමුදල් යොදවන්නේ නම් එම මාර්ග සභාව වෙත පවරාගෙන තිබිය යුතුයි යන්න පවසා සිටින ලදී.
ගරු නාගරික මන්ත්‍රි වසන්ත ගුණරත්න මැතිතුමන් විසින් අදහස් දක්වමින් ගිය සභාවාරයේදී ද තමන් මෙම සංවර්ධනයන් සඳහා මුදල් ලැබෙන්නේ කොහෙන්ද යන්න විමසා සිටි බවත් වරප්‍රසාද ගැනීම කෙසේ වුවද මුදල් වෙන් කිරීමේදී සැමට සාධාරණ විය යුතු බවත් එසේ නොවූ විට වියදම් සඳහා අනුමැතිය ලබාදිය නොහැකි බවත් පවසා සිටින ලදී.එමෙන්ම චෙක්නෝල් මාර්ගයේ සංවර්ධන කටයුතු පිළිබඳ අදහස් දක්වා සිටි ගරු නාගරික මන්ත්‍රි වසන්ත ගුණරත්න මැතිතුමන්

අදාළ කොට්ඨාශය ජයග්‍රහනය කරන ලද මන්ත්‍රිවරයා ලෙස එම කොට්ඨාශයේ සංවර්ධනයන් පිලිබඳව දනුවත් නොකිරීම අතිශය කනගාටුවට කරුණක් බවත් පවසා සිටින ලදී.මෙම කරුණු සනාථ කරමින් ගරු නාගරික මන්ත්‍රි ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන්ද අදහස් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් ද අදහස් දක්වමින් මන්ත්‍රි ප්‍රතිපාදනවලට අමතරව කොට්ඨාශයේ සංවර්ධනය සඳහා වෙන්කර ඇති ලක්ෂ 6 සඳහා මේවන විට ප්‍රමුඛතාවය අනුව යෝජනා ස්ථිර වී ඇති බැවින් ඒවා ක්‍රියාත්මක කිරීම කෙරෙහි ගරු සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටින ලදී.

මෙහිදි ගරු උප සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් මින් පසුව කොට්ඨාශවල සංවර්ධන කටයුතු සිදු කිරීමේදි ඊට මත්තෙන් අදාළ කොට්ඨාශයේ මන්ත්‍රිවරයා දනුවත් කරන ලෙස ඉල්ලා සිටින ලදී. විරෝධතා නොමැති හෙයින් මෙම ඇස්තමේන්තු ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 05. මන්ත්‍රි යෝජනා

### *05ඃ01 ගරු නාගරික මන්ත්‍රි කේ.ජී.පේමදාස මැතිතුමා*

05ඃ01ඃ01 අක්කර 18 ප්‍රදේශයේ දයා මෝටර්ස් ඉදිරිපස සිට හිටපු ප්‍රදේශීය මහ ලේකම් සමන් රත්නායක මහතාගේ නිවස දක්වා වූ සමගි මාවත ප්‍රතිසංස්කරණය කර කාණු පද්ධතිය පිළිසකර කිරීම

05ඃ01ඃ02 මස්කඩ සඳහා ටෙන්ඩර් කැඳවීමේදී කොන්දේසියක්ව ඇති මස් සපයා ගැනීම සඳහා අවශ්‍ය ගෝ ඝාතකාගාර නගර සභා බල ප්‍රදේශය තුළම පිහිටා තිබිය යුතුය යන කොන්දේසිය ඉවත් කර බල ප්‍රදේශයට පිටතින්ද මස් සපයා ගැනීම සඳහා අවශ්‍ය විධිවිධාන සකස් කිරීම

ගරු නාගරික මන්ත්‍රි කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී තම යෝජනා පිළිබඳ අදහස් ප්‍රකාශ කරන ලද ගරු නාගරික මන්ත්‍රි කේ.ජී.පේමදාස මැතිතුමා අක්කර 18 ප්‍රදේශයේ දයා මෝටර් ඉදිරිපස සිට හිටපු ප්‍රාදේශීය මහ ලේකම් සමන් රත්නායක මහතාගේ නිවස දක්වා වූ සමගි මාවතේ තැනින් තැන වළවල් දක්නට ඇති බවත් කඩිනමින් නඩත්තු කටයුතු සිදු නොකළ හොත් වැඩි පිරිවැයක් දරා ප්‍රතිසංස්කරණය කිරීමට සිදුවන බවත් පවසා සිටින ලදී.

එමෙන්ම මස්කඩ සඳහා ටෙන්ඩර් කැඳවීමේදී කොන්දේසියක්ව ඇති මස් සපයා ගැනීම සඳහා අවශ්‍ය ගෝ ඝාතකාගාර නගර සභා බල ප්‍රදේශය තුළම පිහිටා තිබිය යුතුය යන කොන්දේසිය ඉවත් කර බල ප්‍රදේශයට පිටතින්ද මස් සපයා ගැනීම සඳහා අවශ්‍ය විධිවිධාන සකස් කිරීම සිදු කල යුතු බවත්, මෙම කොන්දේසිය නිසා මස් කඩ ටෙන්ඩරයෙන් සභාවට ලැබිය හැකි විශාල ආදායමක් අහිමි වූ බවත් පවසා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් අදහස් දක්වමින් නගරය තුළට නගරයට පිටින් මස් ගෙනා විට එහි කිසිදු පාලනයක් නැතිවෙන හෙයින්, නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමන්ගේ සහය ඇතිව නීත්‍යානුකූලව සිදු කරන ලෙස පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමන් විසින් ලබන වර්ෂයේදි සභාවේ ආදායම පිලිබඳව සිතා බලා මේ පිළිබද පියවරක් ගැනීම සුදුසු බවට ප්‍රකාශ කල අතර, ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් අදහස් දක්වමින් තම පෞද්ගලික මතය අනුව නගරය තුල ගෝ ඝාතකාගාරයක් අළුතින් ඇති කිරීම සඳහා සංස්කෘතික හා බෞද්ධ මට්ටමින් අනුමත කිරීමක් සිදු නොවෙනු ඇති බවත්, සභාවට ලැබෙන ආදායම මෙන්ම,නගරය තුළ ගෝ ඝාතකාගාරයක් ඇති කිරීම යන දෙඅංශය පිළිබදවම විශ්ලේෂනයක් සිදුකර සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම යෝග්‍ය බවත් පවසා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමන් විසින් අදහස් දක්වමින් තම යෝජනාව වූයේ ගෝ ඝාතකාගාරයක් ඇති කිරීම නොව සභා රීතිවලට අනුව නගරයට පිටින් මස් ගෙන ඒම නොහැකි යන රීතිය වෙනස් කර නගරයට පිටින් මස් ගෙන ඒමට හැකි වන සේ රීති සංශෝධනය කිරීම පිළිබදව බව පවසා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමන් විසින් අදහස් දක්වමින් බලන්ගොඩ මස් ටෙන්ඩරය ඒකාධිකාරයක් පවත්වාගෙන යන බවට මතයක් පවතින බවත් එම මතය බිදීමට අවශ්‍ය බවත්, පනතේ 128 වගන්තියෙන් මේ සඳහා ලබාදී ඇති බලය අනුව ගෝ ඝාතකාගාරයේ ගැටළුව නොව මහජන සෞඛ්‍යය පරීක්ෂකගේ නිර්දේශය අනුව මේ සම්බන්ධව ක්‍රියාත්මක විය හැකි බව පවසා සිටින ලදී. . විරෝධතා නොමැති හෙයින් මෙම යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***මෙම අවස්ථාවේ ප.ව.12.15 ට පමණ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් සභා ගර්භයෙන් නික්ම යන ලදී.***

***05:02 ගරු නාගරික මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා***

05:02:01 උඩ ඇල්ලෙපොල සමගි අවමංල්‍යාධාර සමිතියට ප්ලාස්ටික් පුටු ලබාදීම - රු. 50,000.00

05:02:02 බලන්ගොඩ උඩ ඇල්ලෙපොළ සරණ අවමංගල්‍යාධාර සමිතියට හට් එකක් ලබාදීම රු. 75,000.00

05:02:03 මාළිගාතැන්න එකමුතු සුහසාධක සමිතියට හට් එකක් ලබාදීම රු. 75,000.00

ගරු නාගරික මන්ත්‍රි අකිළ එල්ලාවල මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඉහත සඳහන් යෝජනා තුන සඳහා ප්‍රතිපාදන ලබාදීමට ගරු සභාපතිතුමන් එකග වූ අතර එම යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

*මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රි* අකිළ එල්ලාවල මැතිතුමන් විසින් තම කොට්ඨශයේ විසදුම් ලබා ගත යුතු තවත් ගැටළු දෙකක් පවතින බවත් ඉන් ප්‍රධානතම ගැටළුව සොහොන් පිට්ටනියේ ගැටළුව බවත් ඒ සඳහා අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කොට විසදුමක් ලබාදිය හැකි නම් අහිංසක ගම්වාසීන් බොහොමයකට ඉන් මහත් වූ යහපතක් සැලසෙන බවත් බවසා සිටින ලදී.එමෙන්ම, *ගගට බැසීමට පඩිපෙලක් ඉල්ලා සිටින ගම්වාසීන්ට වර්ෂාව වෙලාවට ගගට බැසීම වැනි අවස්ථාවල ඇතිවෙන අපහසුතාවය පිලිබඳ සලකා බලා ඒ පිළිබඳ අවශ්‍ය කටයුතු සිදුකරදෙන මෙන් පවසා සිටින ලදී.*
*මෙහිදී ගරු සභාපතිතුමන් විසින් එම යෝජනා ලිඛිතව ලබාදෙන ලෙසත්* සොහොන් පිට්ටනියේ ගැටළුව පිළිබඳ මීට පෙරද සාකච්ඡා කර ඇති අතර විසඳුමක් ලබාගැනීමට නොහැකි වූ බවත් පවසා සිටින ලදී.

***05:03 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා***

05:03:01 තද වර්ෂාවට පසුගිය දිනවල කැඩී ගිය තානායම් පිවිසුම් පාරට ඇතුළුවන පැතිබැම්ම බැඳීම.

05:03:02 තානායමට යෑමට ඇති මාර්ගය අසළ ලංගම බස් හා පෞද්ගලික බස් නවතා මගීන් නංවා ගැනීම නිසා තානායමට යෑමට එන වාහන ඇතුළු කීරීමට නොහැකි බැවින් සුදුසු පිලියමක් යෙදීම.

05ඃ03ඃ03 තළතා අතුකෝරාළ මැතිනියගෙන් රුපියල් ලක්ෂ 10ක සංවර්ධන යෝජනාවක් ඉල්ලා සිටිම.

05ඃ03ඃ04 කොට්ඨාශයේ සංවර්ධනය සඳහා සභාව මගින් වෙන්කරන ලද ලක්ෂ 10 න් ලක්ෂ 4 ක් පුද්ගලික මන්ත්‍රි ප්‍රතිපාදන සඳහා ලබාදී ඉතිරි ලක්ෂ 6 ද එම කර්මාන්තයේ ඉදිරි කොටස් සඳහා යොදවා එම කර්මාන්ත අවසන් කිරීම.

05ඃ03ඃ05 සුදර්ශනගම පන්සල ළඟ කැඩීයන ස්ථානයට පැති බැම්මක් යෙදවිම.

05ඃ03ඃ06 කරවිකැටිය මාර්ගයේ වලවල් හැරි ඇති ස්ථාන සඳහා ප්‍රිමික්ස් යොදා පිලිසකර කිරීම

05ඃ03ඃ07 2014 වර්ෂයේ බෝම්බුව අමරපාල මහතාගේ කඩය අසළ රු.ලක්ෂ 15 වියදම් කර එක් ගමකට එක් වැඩසටහනක් යටතේ පාර පුළුල් කිරීම සඳහා බැදි තාප්පයේ ඉතිරි කොටසට සභා මුදලින් සකස් කර කොන්ක්‍රීට් ස්ලැබ් දැමීම.(උදා. නගර සභා විශ්‍රාම ගිය ආනන්ද මහතාගේ නිවාස වලට යන මාර්ගය)

05ඃ03ඃ08 අමරපාල මහතාගේ කඩ අසළ ගසන පැති බැම්ම සමඟ පළල් වූ මාර්ගයට දමා ඇති ඉන්ටර්ලොගින් ගල් ඇල්ලීම.

05ඃ03ඃ09 ඉරිදා පොළ සිට පොදු වෙළෙඳ සැල දක්වා සාදා ඇති මාර්ගය අබලන් වී ඇති බැවින් කඩිනමින් සංවර්ධනය කිරීම.

05ඃ03ඃ10 ළමා උයන හා ක්‍රීඩා පිටිය අතර ඇති බිම් තීරුව වාහන නැවැත්වමට සුදුසු පරිදි ඉන්ටර්ලොකින් ගල් ඇල්ලීම.

05ඃ03ඃ11 ජී. ඩී. ෂෙල්ටන් සෙබස්තියන් අල්මේදා - කිරිදිගල මැදපාර නානලිඳ අලුත්වැඩියා කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර දීම

*ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා හදිසි අවශ්‍යතාවයක් මතු වූ බැවින් සභා ගර්භයෙන් පිටව ගිය බැවින් ඔහු විසින් ඉදිරිපත් කිරීමට නියමිත යෝජනා ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් ඉදිරිපත් කල අතර එම යෝජනා ගරු නාගරික මන්ත්‍රි වසන්ත ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.*

*මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් තද* වර්ෂාවට පසුගිය දිනවල කැඩී ගිය තානායම් පිවිසුම් පාරට ඇතුළුවන පැතිබැම්මේ බට ගැලවී ඇති බැවින් එය සකස්කර දෙන ලෙසත්, කොට්ඨාශයේ සංවර්ධනය සඳහා සභාව මගින් වෙන්කරන ලද ලක්ෂ 10 න් ලක්ෂ 4 ක් පුද්ගලික මන්ත්‍රි ප්‍රතිපාදන සඳහා ලබාදී ඉතිරි ලක්ෂ 6 ද එම කර්මාන්තයේ ඉතිරි කොටස් සඳහා යොදවා එම කර්මාන්ත අවසන් කිරීම සිදු කිරීම කෙරෙහි ගරු සභාවේ අවධානය යොමුකරන ලෙසත්, සුදර්ශනගම පන්සල ළඟ කැඩීයන ස්ථානයට පැති බැම්මක්

සකස් කර දෙන ලෙසත් ,තමා විසින් මාස පහක් තිස්සේ කරන ලද ඉල්ලීමක් වන කරවිකැටිය මාර්ගයේ වලවල් හැරි ඇති ස්ථාන සඳහා ප්‍රිමික්ස් යොදා පිලිසකර කරදෙන ලෙස මෙන්ම ඉහතින් දක්වා ඇති අනෙකුත් සංවර්ධන යෝජනා කෙරෙහි ගරු සභාවේ අවධානය යොමුකර එම කටයුතු සිදු කර දෙන ලෙසත් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.

*මේ සඳහා පිළිතුර ලබාදුන් ගරු සභාපතිතුමන් විසින්* තද වර්ෂාවට පසුගිය දිනවල කැඩී ගිය තානායම් පිවිසුම් පාරට ඇතුළුවන පැතිබැම්ම බැඳීම පිළිබඳ මේ වන විට ක්‍රියාමාර්ග ගෙන ඇති බවත්, තානායමට යෑමට ඇති මාර්ගය අසළ ලංගම බස් හා පෞද්ගලික බස් නවතා මගීන් නංවා ගැනීම නිසා තානායමට යෑමට එන වාහන ඇතුළු කිරීමට නොහැකි බැවින් ඊට පිලියමක් යෙදීමේ ප්‍රායෝගික ගැටළුවක් පවතින බවත්, ඉදිරිපත් කර ඇති අනෙකුත් සංවර්ධන යොජනා ඉදිරියේදි ක්‍රියාත්මක කිරීම කෙරෙහි පියවර ගන්නා බවත්, ජී. ඩී. ෂෙල්ටන් සෙබස්තියන් අල්මේදා - කිරිදිගල මැදපාර නානලිඳ අලුත්වැඩියාව පිළිබඳ කරුනු සොයා බැලූ අතර,පුද්ගලික ඉඩමක පවතින ළිඳක් බැවින් එහි අයිතිකරු ඒ සඳහා අකමැත්ත ප්‍රකාශ කල බවත් ලවසා සිටින ලදී.

*විරෝධතා* නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

### *05ඃ04 ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා*

05ඃ04ඃ01 සේනක පෙදෙසේ මාර්ගය අවසානයේ වාහන හරවන ස්ථානය අසලින් වැටී ඇති අතුරු මාර්ගය අඩි 04 ක් පළලට අඩි 30ක් දිගට කොන්ක්‍රීට් කර දීම

05ඃ04ඃ02 සේනක පෙදෙසේ මාර්ගයේ වාහන දෙකක් මාරුවීමට ඇති එකම ස්ථානයේ මැද පිහිටා ඇති විදුලි කණුව බැම්ම අසලින් සවිකිරීමට නගර සභාව මගින් විදුලි බල මණ්ඩලයට ඉල්ලීමක් කිරීම

05ඃ04ඃ03 සිටි ගාර්ඩ්න් මාර්ගය අවසානයේ වාහන හැරවීමට ඇති එකම ස්ථානය අඩි 10 ක් පළලට අඩි 25ක් දුරට කොන්ක්‍රීට් කරදීම

05ඃ04ඃ04 හිල් සයිඩ් මාර්ගයෙන් කරවිකැටියට දේශබන්දු මහතාගේ නිවස අසලින් ඇති අතුරු මාර්ගය මුල සහ අග කාණු දෙකට ස්ලැබ් දමා පළල අඩි 03 දිග අඩි 10 ක් කොන්ක්‍රීට් කරදීම

ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි වසන්ත ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් සේනක පෙදෙසේ මාර්ගය අවසානයේ වාහන හරවන ස්ථානය අසලින් වැටී ඇති අතුරු

මාර්ගය අඩි 04 ක් පළලට අඩි 30ක් දිගට තම පුද්ගලික මන්ත්‍රි ප්‍රතිපාදන යොදවා කොන්ක්‍රීට් කර දෙන ලෙසත් ඒ පිළිබඳ ඒ අසළ නිවාස දෙකෙහි නිවාස හිමියන් සමඟ සාකච්ඡා කොට එකඟත්වය ලබාගත් බවත් පවසා සිටින ලදී.

***එමෙන්ම*** සේනක පෙදෙසේ මාර්ගයේ වාහන දෙකක් මාරුවීමට ඇති එකම ස්ථානයේ මැද පිහිටා ඇති විදුලි කණුව බැම්ම අසලින් සවිකිරීමට නගර සභාව මගින් විදුලි බල මණ්ඩලයට ඉල්ලීමක් කිරීම සිදු කරන ලෙස ඉල්ලා සිටි ගරු සභාපතිතුමන්, තම පුද්ගලික මන්ත්‍රි ප්‍රතිපාදන යොදවා සිටි ගාර්ඩ්න් මාර්ගය අවසානයේ වාහන හැරවීමට ඇති එකම ස්ථානය අඩි 10 ක් පළලට අඩි 25ක් දුරට කොන්ක්‍රීට් කරදීම සිදුකරදෙන ලෙසත්, තම පුද්ගලික මන්ත්‍රි ප්‍රතිපාදන යොදවා හිල් සයිඩ් මාර්ගයෙන් කරච්කැටියට දේශබන්දු මහතාගේ නිවස අසලින් ඇති අතුරු මාර්ගය මුල සහ අග කාණු දෙකට ස්ලැබ් දමා පළල අඩි 03 දිග අඩි 10 ක් කොන්ක්‍රීට් කරදීම සිදුකරදෙන ලෙසත් බවසා සිටින ලදි.මේ සඳහා *විරෝධ*තා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:05 ගරු නාගරික මන්ත්‍රිනි පී. චන්ද්‍රලතා මැතිතුමිය***

05:05:01 බළන්ගොඩ වැඩිහිටි බල මණ්ඩලයේ වැඩිහිටි සැමරුම් උළෙල සඳහා රු. 15,000.00 ක මුදලක් පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන වලින් ලබාදීම

05:05:02 බළන්ගොඩගෙදර හුණුකුඹුර අතුරු මාර්ගයක් වන ෆාරුක් මහතාගේ නිවස අසල සිට රොෂාන් කැලිස්ටස් මහතාගේ නිවස දක්වා මීටර් 100 ක් කොන්ක්‍රීට් පාරක් සාදාගැනීම

05:05:03 සුනිල් ගරාජය අසල සිට පී. චන්ද්‍රලතා මහත්මියගේ නිවස දක්වා කොන්ක්‍රීට් කිරීම

05:05:04 රණවිනා වත්ත ගමට ජලය ලබාදීම සම්බන්ධව නගර සභාව මගින් සිදුකරන බවට යෝජනා වුවත් මේ වන තෙක් ක්‍රියාත්මක නොවන බැවින් තම පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන වලින් ජලය ලබාදීමට අනුමැතිය ඉල්ලා සිටීම

ගරු නාගරික මන්ත්‍රිනි පී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රිනි පී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් බළන්ගොඩ වැඩිහිටි බල මණ්ඩලයේ වැඩිහිටි සැමරුම් උළෙල සඳහා රු. 15,000.00 ක මුදලක් පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන වලින් ලබාදෙන ලෙස පවසා සිටි අතර, බළන්ගොඩගෙදර හුණුකුඹුර අතුරු මාර්ගයක් වන ෆාරුක් මහතාගේ නිවස අසල

සිට රොෂාන් කැලිස්ටස් මහතාගේ නිවස දක්වා මීටර් 100 ක් කොන්ක්‍රීට් පාරක් සාදාගැනීම කෙරෙහි ගරු සභාවේ කඩිනම් අවධානය යොමුකරන ලෙසත්, සුනිල් ගරාජය අසල සිට පී. චන්ද්‍රලතා මහත්මියගේ නිවස දක්වා ඉතා අබලන් තත්වයේ පවතින බැවින් කොන්ක්‍රීට් කර දෙන ලෙසත්, පවසා සිටින ලදී.

එමෙන්ම රණවිනා වත්ත ගමට ජලය ලබාදීම සම්බන්ධව නගර සභාව මගින් සිදුකරන බවට යෝජනා වුවත් මේ වන තෙක් ක්‍රියාත්මක නොවන බැවින් එම ගෙවල් 16 ක පමණ ගම්වාසීන් ජලය නොමැතිකමින් අපහසුතාවයට පත් වී ඇති නිසා තම පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන වලින් හෝ ජලය ලබාදීමට කටයුතු කරන මෙන් පවසා සිටින ලදී. මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් මේ වන විටත් ඇස්තමේන්තු සකස් වෙමින් පවතින බැවින් එම කටයුතු අවසන් වූ පසු සැමගේ සහයෝගයෙන් එම කාර්යය සිදු කිරීමට පියවර ගන්නා බවට පවසා සිටින ලදී. විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රි කේ.පී.පේමදාස මැතිතුමන් විසින් බළන්ගොඩ වැඩිහිටි බල මණ්ඩලයේ වැඩිහිටි සැමරුම් උළෙල සඳහා රු. 15,000.00 ක මුදලක් පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන වලින් ලබාදීම සම්බන්ධයෙන් ගරු නාගරික මන්ත්‍රිනි පී. චන්ද්‍රලතා මැතිතුමිය වෙත ස්තුතිය පලකරන ලදී.

***05:06 ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා***

05:06:01 ඕලුගංතොට පන්සල අසල පැතිබැම්ම ඉදිකිරීම කරදියමුල්ල ග්‍රාම සංවර්ධන සමිතියට ලබාදෙන මෙන් ඉල්ලීම

05:06:02 ඕලුගංතොට පන්සල අසල අඩිපාලම ඉදිකිරීම කරදියමුල්ල ග්‍රාම සංවර්ධන සමිතියට ලබාදෙන මෙන් ඉල්ලීම

*ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදී ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමාගේ ඉල්ලීමට* අනුව ඕලුගංතොට පන්සල අසල පැතිබැම්ම ඉදිකිරීම කරදියමුල්ල ග්‍රාම සංවර්ධන සමිතියට ලබාදීම හා ඕලුගංතොට පන්සල අසල අඩිපාලම ඉදිකිරීම කරදියමුල්ල ග්‍රාම සංවර්ධන සමිතියට ලබාදීම යන යෝජනා සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:07*** **හදිසි යෝජනා -**

**05:07:01 තුඹගොඩ සුදර්ශනාරාම විහාරස්ථානයට පොත් රාක්කයක් ලබාදීම සඳහා අනුග්‍රහය දැක්වීම**

**තුඹගොඩ සුදර්ශනාරාම විහාරස්ථානයට පොත් රාක්කයක් ලබාදීම සඳහා අනුග්‍රහය දැක්වීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි.**

**මෙහිදී තම පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන යොදවා,**ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය රු.50,000 ක මුදලක්ද, ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා රු.14,000 ක මුදලක්ද,ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා රු.25,000 ක්ද ,ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමා රු.50,000ක්ද, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් රු.10,500.00 ක්ද,ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමන් තම මාසික සභා දීමනාව රු.15,000ක්ද මේ සඳහා ලබාදීමට එකඟත්වය පල කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:07:02 බලංගොඩ පරිවාස කාර්යාලයේ උසාවි ගොඩනැගිල්ල උඩුමුල්ල මෛත්‍රී ග්‍රාම සංවර්ධන සමිතියට ලබාදීම.**

බලංගොඩ පරිවාස කාර්යාලයේ උසාවි ගොඩනැගිල්ල උඩුමුල්ල මෛත්‍රී ග්‍රාම සංවර්ධන සමිතියට ලබාදීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:07:03 බලංගොඩ ආනන්ද මෛත්‍රිය ජාතික පාසලේ පාසල් කළමණාකරන ප්‍රවර්ධන වැඩසටහන සඳහා අනුග්‍රහය දැක්වීම.**

බලංගොඩ ආනන්ද මෛත්‍රිය ජාතික පාසලේ ඉල්ලීම පරිදි පාසල් කළමණාකරන ප්‍රවර්ධන වැඩසටහන සඳහා කසළ කළමණාකරන ස්ථාන දැක බලා ගැනීමට හොරණ හා පිළියන්දල ප්‍රදේශවලට යාමට පාසල් බස් රථයට ඩීසල් ගාස්තු හා අනෙකුත් වියදම් සඳහා රු.9500.00 මුදලක් ලබාදීමට ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කල යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:07:04 නිවාස සැලසුම් අනුමත කිරීම හා සම්බන්ධ නගර සභා ගාස්තු නිදහස් කිරීම.**

බලංගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීම් කර ඇති පරිදි නිවැසියන් තිදෙනෙකු සඳහා පදිංචි ඉඩම නාය යාමේ අධි අවදානම පැවතීම හේතුවෙන් ඉන් ඉවත්කර ලබාදුන් නව ඉඩම් කොටසෙහි නිවසක් ඉදිකිරිමේදි එය සුවිශේෂි අවස්ථාවක් ලෙස සලකා එම ඉඩම් කැබලි තුළ නිවාස ඉදිකිරීම සඳහා එකී ඉඩම් කොටස අනුමත කිරීමටත්, එසේ ඉදිකිරීමට නියමිත නිවාස ඒකක 03 ට අදාළ නිවාස සැලසුම් අනුමත කිරීම හා සම්බන්ධ නගර සභා ගාස්තු අයකිරීමෙන් තොරව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:07:05 2019 වර්ෂයට අදාළ සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අනුමැතිය ලබාගැනීම හා එම දැන්වීම සිංහළ හා දමිල පුවත්පත්වල එක්වරක් පළකිරීමට අනුමැතිය ලබාගැනීම.**

**2019 වර්ෂයට අදාළ සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අනුමැතිය ලබාගැනීම හා එම දැන්වීම සිංහළ හා දමිල පුවත්පත්වල එක්වරක් පළකිරීමට අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින්** ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**2019 වර්ෂය සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.**

| අනු අංකය | කාණ්ඩය | ලියාපදිංචි ගාස්තුව | | | |
|---|---|---|---|---|---|
| | | ගාස්තුව රු. | VAT රු. | NBT රු. | එකතුව රු. |
| 01. | කාර්යාල උපකරණ හා ලිපි ද්‍රව්‍ය | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 02. | වානේ ගෘහ භාණ්ඩ හා ලී බඩු | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 03. | පරිගණක, පරිගණක උපාංග හා මුද්‍රණ තීන්ත, CD තැටි, ටෝනර්, කාර්ට්රිජ්, රිබන්, පරිගණක මෘදුකාංග | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 04. | ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 05. | මාර්ග නඩත්තු උපකරණ හා ද්‍රව්‍ය 6×9, 6×4, 4×4, 4×2, 2×2, 1 1/2, 1, 3/4, 1/2 ප්‍රමාණයේ කළුගල්, ගල් කුඩු, ABC, සියලුම ජල සැපයුම් පයිප්ප හා උපාංග, හියුම් පයිප්ප, කොන්ක්‍රීට් නිෂ්පාදන, ගංගා වැලි | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 06. | නාම පුවරු, දැන්වීම් හා සමරු ඵලක, බැනර්, කටවුට්, ඩිජිටල් පෝස්ටර් ආදිය | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 07. | ක්‍රීඩා භාණ්ඩ, ළදරු පාසල් උපකරණ | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 08. | තීන්ත වර්ග ( එනමල්, ඉමල්ෂන්, මළ නිවාරණ තීන්ත) | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 09. | විදුලි උපකරණ ( විදුලි පහන් ඇතුළු සියලු විදුලි අයිතමයන්) | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 10. | මුද්‍රණ කටයුතු හා රබර් මුද්‍රා නිෂ්පාදන, මුද්‍රිත පෝරම | 500.00 | 76.53 | 10.20 | 586.73 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 11. | කාර්යාල උපකරණ අලුත්වැඩියාව (යතුරුලියන, ඡායා පිටපත් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, වේලා සටහන් යන්ත්‍ර, පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර ආදී අනිකුත් යන්ත්‍ර | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 12. | වාහන සේවා/අලුත්වැඩියා, වාහන අමතර කොටස් (ටයර්, ටියුබ්, බැටරි ඇතුළු අනෙකුත් අමතර කොටස්) | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 13. | කුලී පදනම මත ගල් වැලි ප්‍රවාහනය සඳහා ටිපර් රථ සැපයීම. | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 14. | සෞඛ්‍යය උපකරණ හා විෂබීජ නාශක ද්‍රව්‍ය (සබන්, කුණු ඉවත් කිරීමේ ද්‍රව්‍ය) | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 15. | පිඟන් භාණ්ඩ | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 16. | පුස්තකාල පොත් | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 17. | නිළ ඇඳුම් සඳහා රෙදි සැපයීම. | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 18. | ශ්‍රව්‍ය උපකරණ, දෘශ්‍ය උපකරණ, පටිගත කිරීම් උපකරණ ආදිය සැපයීම. | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 19. | පරිභෝජන භාණ්ඩ, වියළි සහ අනිකුත් ආහාර ද්‍රව්‍ය සැපයීම. | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 20 | ඉහත සඳහන් නොවුණු වෙනත් අයිතමයන් (සඳහන් කරන්න) | 500.00 | 76.53 | 10.20 | 586.73 |

**කොන්ත්‍රාත්කරුවන්**

| අනු අංකය | කාණ්ඩය | ලියාපදිංචි ගාස්තුව | | | |
|---|---|---|---|---|---|
| | | ගාස්තුව රු. | VAT රු. | NBT රු. | එකතුව රු. |
| 01. | රු. 100,000/- දක්වා | 500.00 | 76.53 | 10.20 | 586.73 |
| 02. | රු. 100,000/- සිට 250,000 දක්වා | 750.00 | 114.79 | 15.30 | 880.09 |
| 03. | රු. 250,000 සිට රු. 500,000/- දක්වා | 1000.00 | 153.06 | 20.40 | 1173.46 |
| 04. | රු. 500,000/- සිට 1,000,000 දක්වා | 1250.00 | 191.31 | 25.50 | 1466.81 |
| 05. | රු. 1,000,000/- ට වැඩි | 1500.00 | 229.59 | 30.00 | 1759.59 |

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ07ඃ06 අනුකූලතා සහතිකය ලබාගැනීමේ කාලය දීර්ඝ කර ගැනීම.**

අනුමත සැලසුම් සඳහා අනුකූලතා සහතිකය වසර 3 සඳහා ලබාදීම ප්‍රමාණවත් නොවන අතර සේවාදායකයින් ඉන් මහත් සේ අපහසුතාවයට ලක්වෙන බැවින් එහි කාලය වසර 6 ක් දක්වා දීර්ඝ කිරීම සුදුසු බවත් ඒ සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීමක් කිරීම සඳහාත් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යොජනාව ගරු සභාපතිතුමන් විසින් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.

මෙහිදී 2018.10.02 දින පැවති මුදල් හා කර්මාන්ත කමිටු වාර්තාව හා 2018.10.18 දින පැවති මුදල් හා කර්මාන්ත කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහිදී මුදල් කමිටු වාර්තා යටතේ 2018.10.02 දින වාර්තාවේ අංක 06 යටතේ ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් නීතිඥ්‍ය මහතුන්ට සඳහා ඉදිකරන ගොඩනැගිල්ල යන අදහස වැරදි බැවින් එය සංශෝධනය විය යුතු බව ගරු නාගරික මන්ත්‍රි ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් පෙන්වා දෙන ලදී.

එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය මගින් කාර්පාක් ඉදිරිපිට ඉදිකෙරෙන නව ගොඩනැගිල්ලේ රථ වාහන නැවතීමට ඉඩ පහසුකම් සපයා නොමැතිකම පිළිබඳ කරුණු දක්වූ ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් අහිංසක මිනිසුන් පිරිසක් එදිනෙදා ජීවිකාව සරිකර ගන්නා කාර්පාක් රථගාල නීතිඥ්‍ය වාහන ගාල් කිරීම සඳහා කිසිසේත් ලබාදිය නොහැකි බව පවසා සිටින ලදී.

## 07. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.

| | |
|---|---|
| **පුනරාවර්ථන ලැබීම්** | **8,708,272.23** |
| **වෙනත් ලැබීම්** | **2,271,349.55** |
| **මුලු ලැබීම්** | **10,979,621.78** |
| **පුනරාවර්ථන වියදම්** | **10,680,602.87** |
| **වෙනත් වියදම්** | **4,059,215.18** |
| **මුලු වියදම්** | **14,739,818.05** |

ආදායම් වියදම් වාර්තා සළකා බැලීම යටතේ කොම්පෝස්ට් අදායම පිලිබදව යම්යම් ගැටළු සහගත තත්වයන් පවතින බවත් එහි ලාභ අලාභ පිලිබඳ මාසිකව අධ්‍යයනයක් කෙරෙයි නම් ඒ පිළිබඳ ගරු සභාව දැනුවත් කර කොම්පෝස්ට් පොහොර නිපදවීම තුළ සාධාරණ ප්‍රතිඵලයක් තිබේද යන්න පිළිබද ගරු සභාව දැනුවත් කරන ලෙස ගරු නාගරික මන්ත්‍රි වසන්ත ගුණරත්න මැතිතුමන් විසින් පවසා සිටින ලදී.

**එහිදී ගරු සභාපතිතුමන් විසින් ඒ සඳහා උපදෙස් ලබාදෙන බව පවසා සිටින ලදී.**

- **ඉන්ධන වාර්තාව සභාවට ඉදිරිපත් කිරිම.**

**2018 -10-01 සිට 2018-10-31 දක්වා**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 150-0248 | 1,450.00 |
| 227-5020 | 47,560.00 |
| | 1,015.00 |
| 37-7933 | 3,790.00 |
| BC-0005 | 46,125.00 |
| DPP -0006 | 6,375.00 |
| DDR0008 | 3,150.00 |
| FCON0015 | 615.00 |
| GC 0001 | 4,060.00 |
| GC 0001 | 7,285.00 |
| FP 0002 | 8,400.00 |
| GK-1483 | 23,081.00 |
| GK-6227 | 43,680.00 |
| GK-6227 | 538.00 |
| JD-4684 | 3,100.00 |
| | 1,490.00 |
| LL-2110 | 16,309.00 |
| LL-2110 | 7,115.00 |
| LL-7688 | 14,760.00 |
| HF-8558 | 10,824.00 |
| ND-5124 | 49,815.00 |
| OV/M 0017 | 1,341.00 |
| PF-4006 | 24,339.00 |
| PF-4006 | 6,731.00 |
| QL-2901 | 3,576.00 |
| QL-2901 | 6,200.00 |
| RB-4786 | 33,360.00 |
| | 538.00 |
| 150-0248 | 1,490.00 |
| RC-1107 | 25,065.00 |
| RC-1107 | 1,590.00 |
| wl -7897 | 1,550.00 |
| RC-1118 | 56,280.00 |
| VI-1833 | 1,240.00 |
| RD-8000 | 6,150.00 |
| RD-8240 | 25,215.00 |

| | |
|---|---|
| PH - 4942 | 4,920.00 |
| RE-2600 | 40,590.00 |
| MIXB-0011 | 3,640.00 |
| UQ - 1933 | 1,490.00 |
| UQ - 1933 | 1,782.50 |
| 226-7521 | 7,380.00 |
| BFS-4462 | 1,450.00 |
| MB-9008 | 1,240.00 |
| ZA-5039 | 61,500.00 |
| **එකතුව** | **617,744.50** |

විරෝධතා නොමැති හෙයින් ආදායම් වියදම් වාර්තා සහා සම්මත විය.

## 08. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්

**● ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් අදහස් දක්වමින් පෙර දිනක මුද්‍රිත මාධ්‍යයකද සඳහන් ව තිබූ පරිදි බලංගොඩ ඩිපෝ පරිශ්‍රයට හා ආරක්ෂකයෙකුට නගර සභා මන්ත්‍රීවරයෙකු හා ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයෙකු විසින් පහර දී ඇති බවත් එවන් රාජ්‍යය දේපළ හානි කිරීමට කෙසේවත් ඉඩදිය නොහැකි බවත් ,මෙවන් ක්‍රියා දැඩි ලෙස හෙළා දකින අතර මින් පසුව එසේ නොවීමට වගබලා ගතයුතු බවද පවසා සිටින ලදී.

**● ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමා**

●ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමා අදහස් දක්වමින් පෙර සභාවේදි දැනුම් දුන් පරිදි ආදායම් වියදම් වාර්තාවේ සකස් කරන නිළධාරීන්ගේ නම් සඳහන් කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන බව පවසා සිටි අතර, ඉන්දුනීසියාවේ සුරබයා සංචාරය සඳහා සහභාගි වූ මන්ත්‍රීවරු දෙපළගේ ප්‍රමාද ගමන් ගාස්තු ගෙවීමට විරුද්ධ වීම වැනි පහත් මට්ටමේ දේශපාලනයක තමා නිරත නොවෙන බවද පවසා සිටින ලදී. තවද නගරයේ සියළු මාර්ගයන්ගේ අයිතිය මාර්ග සංවර්ධන අධිකාරිය සතු වුවද නැවතුම් ගාස්ත අයකරන්නේ නගර සභාව මිස මාර්ග සංවර්ධන අධිකාරිය නොවන නිසා එහි ගැටළුවක් ඇති නොවන බවත් ,එම ආයතන දෙක අතර අවබෝධයෙන් සිදුවන්නක් බවත් පවසා සිටින ලදී.

- එමෙන්ම නගරයේ දිනෙන් දින උග්‍රවන සුනඛ ප්‍රශ්නය පිළිබඳ කඩිනම් තීන්දුවක් ගත යුතු බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමා පශු වෛද්‍ය කාර්යාලයේ ද සහය ඇතිව මේ සඳහා කඩිනමින් විසඳුම් සෙවිය යුතු බව පවසා සිටින ලදී. නගරයේ ක්‍රියා විරහිතව ඇති විදුලි පහන් සම්බන්ධයෙන් කරුණු පෙන්වා දුන් ගරු නාගරික මන්ත්‍රීතුමා ඒවා යථාතත්වයට පත්කරන ලෙස පවසා සිටින ලදී.එමෙන්ම පෙර සභාවලදී සිදුවූ පරිදි ඉරිදා දින සතිපොල අවසන් වීමෙන් පසු එදින රාත්‍රියේම පොළ භූමිය සුද්ධ පවිත්‍ර කර සඳුදා උදෑසනම නගරයේ කාණු ශුද්ධ පවිත්‍ර කිරීමෙන් සඳුදා උදෑසන රාජකාරි ආරම්භ කරන සියළු දෙනාටම යහපත් වටපිටාවක් ගොඩනැගෙන බවත් පවසා සිටින ලදී.
- ඉදිරියේදී පැනනැගිය හැකි ලොකුම ප්‍රශ්නය වන ඝන අපද්‍රව්‍යය කළමණාකරනය පිළිබඳව දැන් සිටම නිවැරදිව කළමණාකරනය කරගත යුතු බවත්,කසළවලින් නවෝත්පාදනයන් කරන ආයතන ,ජාත්‍යන්තර ආයතන පවතින බවත් එම ආයතනවල සහාය ලබාගැනීමට හොද ප්‍රමිතියක් සහිතව කසළ කළමණාකරනය කරගත යුතු බවත් පවසා සිටින ලදී.එමෙන්ම නගරයේ නව ඉදිකිරීම් සිදු කිරිමේදි නිවැරදි සැලැස්මකට අනුව ඉදිරි වසර 50 ට 60 සරිලන පරිදි සැලැසුම් සකස් කල යුතු බවත් පවසා සිටින ලදී.
- එමෙන්ම ජාතික වශයෙන් දේශපාලන පරිවර්තනයක් සිදු වී ඇති මෙම අවස්ථාවේ දැනට ග්‍රාම ශක්ති යොජනා සිදුකිරීමට මැදිහත් වී මුදල් ලබාදීමට කටයුතු කරන බවත් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින් අවසන් වශයෙන් වසර අවසානයේ නගර සභාවේ සියළු මන්ත්‍රිවරුන් , සියළු නිළධාරින් හා සියළු සේවකයන් අතර සුහද හමුවක් පැවැත්වීමට ද යෝජනා කරන ලදී.

- <u>**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා**</u>

- ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා අදහස් දක්වමින් දිවංගත හිටපු සභාපති විමළසේන වැවේගෙදර මැතිතුමන්ට හා ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමයගේ පියාගේ අභාවය වෙනුවෙන් ශෝකය පල කිරීමට මෙය අවස්ථාවත් කර ගන්නා බවත්, 2002 දී විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබමින් නගර සභාවට සභාපති ලෙස තේරි පත් වූ විමළසේන වැවේගෙදර මැතිතුමා කිසි දිනෙක කිසිවෙකුගෙන් ශත 5 ක මුදලක්වත් ගසා නොකෑ සභාපතිවරයෙක් බව නොබියව පැවසිය හැකි බව ප්‍රකාශ කරන ලදී.
- එමෙන්ම කසළ කළමණාකරනය පිළිබඳව ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් පැවසූ කරුනු පිළිබද 200% එකගවෙන බව පැවසූ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා

මැතිතුමා ඉන්දුනීසියාවේ සුරබයා නගරයේ කසළ කළමණාකරනය පිළිබඳ නිරීක්ෂණය කල අත්දැකීම් ගරු සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

- එමෙන්ම රටේ පවතින වත්මන් දේශපාලන තත්වය පිළිබඳ කරුණු දක්වා සිටි ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් ඒ පිළිබදව අතිශය කනගාටුවට පත්වන බවත්,සත්‍යය කෙදිනක හෝ ජයගන්නා බැවින් දේශපාලන පිල් බෙදීම් සිදු නොකර ජනතා සේවය සිදු කරමු යන්න පවසා සිටින ලදී.

- <u>**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**</u>

  - ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් අදහස් දක්වමින් දේශපාලනයේදී නිහතමානි විය යුතු බවත් ,බලය ඇති වීම හෝ නැතිවීම ඉතා ක්ෂණිකයෙන් සිදු විය හැක්කක් බවත්,ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් සභාවට පැමිණි මුල් දිනයේ එතුමාගේ ජ්‍යෙෂ්ඨත්වයට ගරුකර එතුමාට හිමි ආසනය ලබාදීමට තරම් නිහතමානී නොවීම සම්බන්ධව සිහිපත් කරන ලදී.
  - එමෙන්ම පළමු සභාවාරයේදි යෝජනා සම්මත කර ගත් පරිදි මහජන ක්‍රීඩාංගනය හා ළමා උයන අතර භූමි ප්‍රදේශයේ රථගාලක් ඉදිකිරීම සම්බන්ධව මේ වන තෙක් ක්‍රියාත්මක නොවීම පිළීබඳ කරුණු විමසා සිටි ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් කඩකුලී තක්සේරුව අඩුකරගැනීම සම්බන්ධයෙන් ආණ්ඩුකාරවරයා වෙත සකස් කරන ලිපියේ ප්‍රගතිය පිළිබඳව විමසා සිටින ලදී.

- <u>**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**</u>

  - ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් අභාව්‍යප්‍රාප්ත හිටපු සභාපති විමලසේන වැවේගෙදර මැතිතුමන්ට හා ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමයගේ පියාගේ අභාවය වෙනුවෙන් ශෝකය පල කිරීමට මෙය අවස්ථාවත් කර ගන්නා බව පවසා සිටින ලදී.
  - වාර්ෂික හොඳම ගිණුම් තැබීම වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් ප්‍රථම ස්ථානයට බලංගොඩ නගර සභාව පත් වීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට හා ගණකාධිකාරිතුමාට සුභාෂිංසන පළ කරන බව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් මෙහිදී ප්‍රකාශ කරන ලදී.
  - මෙහිදී කඩකුලී තක්සේරුව අඩුකරගැනීම සම්බන්ධයෙන් ආණ්ඩුකාරවරයා වෙත සකස් කරන ලිපියේ ප්‍රගතිය පිළිබඳ විමසා සිටි අතර බස් නැවතුමේ සිවිළිම ඉදිකිරීම සම්බන්ධව කරුනු

විමසා සිටින ලදී.එමෙන්ම නගරයට පිවිසුම අසළ ඇති ඔරලෝසු කණුව ආශ්‍රිතව බළන්ගොඩ මානවයා පිලිඹිබු වන ආකාරයේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමේ යෝජනාවක් ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

●තව දුරටත් අදහස් දක්වමින් සේනක පෙදෙසේ නිමල් මහතාගේ නිවස අසළ දුගදක් හමන බැවින් එම තත්වය නළත්වා ගැනීම සඳහා සුදුසු පරිදි සාධාරණ පියවරක් ගන්නා ලෙෂ පවසා සිටින ලද අතර තුරු උයන සංවර්ධන කටයුතු පිලිබදව විමසා සිටින ලදී.එමෙන්ම මොහාන් සාළිය එල්ලාවල මාර්ගය දෙපස ලොකු වළවල් හෑරි ඇති හෙයින් ඒ පිලිබදවද අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටින ලදී. දිනෙන් දින උග්‍රවන සුනඛ ගැටළුව හා ඩෙංගු උවදුර පිළිබදව සභාවේ අවධානය යොමුකල යුතු බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පරන මාකට් එක අසළ වළ උතුරා යෑම සම්බන්ධව හා ක්‍රිඩා පිටිය සංවර්ධනය කල යුතු බවත් එහි ප්‍රේක්ෂකාගාරයේ පුටු නොමැති කමින් ඇතිවන අපහසුතා මගහරවා ගැනීමට සභාව මැදිහත් වී පුටු 25 ත් පමණ මිලදීගනීමටත් මෙහිදී යෝජනා කරන ලදී.

**● ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

● ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් සහෝදරත්වයෙන් දේශපාලනයට පැමිනි උදාර නායකයෙකු වූ අභාව්‍යප්‍රාප්ත හිටපු සභාපති විමළසේන වැවේගෙදර මැතිතුමන්ට හා ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමයගේ පියාගේ අභාවය වෙනුවෙන් ශෝකය පල කරන බව පවසා සිටින ලදී.

● මෙහිදී තව දුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ,ඉතා වටිනා ජල ව්‍යාපෘතියක් වන උඩකන්ද ප්‍රජා ජල ව්‍යාපෘතිය ඉදිකිරීමේදි අරුනළු වැඩසටහන යටෙත් බට එලීම සඳහා ස්කැවේටර් යන්ත්‍ර යොදා මාර්ගය කඩා බට එලමේදි මාර්ගය මුළුමනින් විනාශ වී ඇති හෙයින් මෙය යථා තත්වයට පත්කර ගැනීම සඳහා ගරු සභාවේ මැදිහත්වීම අවශ්‍ය වන බව පවසා සිටින ලදී.

● එමෙන්ම රටේ පවතින වර්තමාන දේශපාලන පරිවර්තනය නිසා රටම ව්‍යාකුල තත්වයට පත්වී ඇති බවත් මෙම තත්වය අතිශය කනගාටුවට කරුණක් බවත් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමන් විසින් ඒ පිලිබඳ තම අදහස් ප්‍රකාශ කරන ලදී.

**● ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා**

● ඉවසීමෙන් ආදර්ශය සැපයූ නිහතමානි නායකයකු වූ අභාවප්‍රාප්ත හිටපු සභාපති විමළසේන වැවේගෙදර මැතිතුමන්ට හා මනුෂ්‍යත්වයෙන් පිරි මිනිසෙකු වූ ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමියගේ පියාගේ අභාවය වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් ශෝකය පල කරන බව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් පවසා සිටින ලදී. එමෙන්ම එතුමා විසින් මෙහිදී රටේ පවතින වත්මන් දේශපාලන වාතාවරණය පිළිබඳ කරුණු දැක්වීමක් සිදු කරන ලද අතර දෙකට කැඩී ගිය ශ්‍රී ලංකා නිදහස පක්ෂය යළි එකම වේදිකාවක එක්ව සිටීම පිළිබදව තමන් සතුටුවන බවද මෙහිදී පවසා සිටින ලදී.

**<u>● ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය</u>**

● ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් අභාවප්‍රාප්ත හිටපු සභාපති විමළසේන වැවේගෙදර මැතිතුමන්ට හා ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමයගේ පියාගේ අභාවය වෙනුවෙන් ශෝකය පල කිරීමට මෙය අවස්ථාවත් කර ගන්නා බව පවසා සිටි අතර ඉන්දුනීසියාවේ සුරබයා නගරයේ චාරිකාවට සහභාගී වීමේ ප්‍රමාද ගුවන් ගාස්තු අදාල මන්ත්‍රිවරු දෙපළට ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් පවසා සිටින ලදී.

**●එමෙන්ම රටේ පවතින අස්ථාවර දේශපාලන තත්වය පිළිබඳව කරුණු පවසා සිටි ගරු** නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය අළුතින් පත්වූ නාගරික මන්ත්‍රිවරුන් ලෙස අත්දැකීම් අඩු බැවින් සිදුවන යම් යම් වැරදී උළුප්පමින් ක්‍රියා නොකරන මෙන් පවසා සිටි අතර,පසුගිය දිනෙක අළුතින් බඳවාගත් දරුවන්ගේ රැකියා අවස්ථා මේවන විට අවදානම් තත්වයකට ඇද දමා ඇතිහෙයින් සුදුසුකම් සහිත එම දරුවන් විශාල මානසික පසුබෑමකට ලක්ව ඇති බවත්, එසේ නොකර ඔවුනට සාධාරණයක් ඉටුකරන ලෙසත් මෙහිදී ඉල්ලා සිටින ලදී.

●උඩකන්ද පාරේ ජල ව්‍යාපෘතියකින් නිතරම ජලය ගලායෑම නිසා එම මාර්ගයේ ගමන් කරන්නන්ට යම් කරදරකාරී ස්වභාවයක් මතු ව ඇති බැවින් එම තත්වය නතර කිරීම සඳහා ගරු සභාවේ අවධානය යොමුකරන ලෙසත්,එම මාර්ගයේ කසළ ට්‍රැක්ටරය තවමත් ගමන් නොකිරීම පිළිබඳවද ගරු සභාවේ අවධානය යොමුකරන ලෙසත්ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින්මෙහිදී ඉල්ලා සිටින ලදී.

**● ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමා**

● මෙහිදී ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින් නැවතත් අදහස් දක්වමින් අභාව්‍යප්‍රාප්ත හිටපු සභාපති විමළසේන වැවේගෙදර මැතිතුමන්ට හා ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමයගේ පියාගේ අභාවය වෙනුවෙන් තම කණ්ඩායම වෙනුවෙන් ශෝකය පල කිරීමට මෙය අවස්ථාවතක් කර ගන්නා බව පවසා සිටින ලදී.

●තව දුරටත් අදහස් දක්වමින් අළුතින් රැකියා දීම පිලිබඳව තම කණ්ඩායමට ගැටළුවක් නොවන බවත්, නිවැරදි ක්‍රමවේදයකට අනුව සභාව දැනුවත් කර සිදු කරන ලෙස පවසා සිටි බවත්,කොට්ඨාශය ජයග්‍රහණය කර මන්ත්‍රිවරුන් බැවින් තම කණ්ඩායමේ සභිකයන් වෙතද මෙහිදී අවස්ථාව ලබාදෙන ලෙෂ ඉල්ලා සිටි බවත්, කිසිදා කිසිවිටෙක තම පක්ෂයේ නායකතුමා පළිගැනීමේ දේශපාලනයක නිරත නොවූ අතර එහි අනුගාමිකයන් වශයෙන් එවන් ජරාජීර්ණ දේශපාලනයක තම දර්ශනය නොවන බවත් ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින් මෙහිදී පවසා සිටින ලදී.

**● ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා**

● ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් පෙර සභාවකදී සාකච්ඡා කිරීමට සිතා පැමිණි කරුණු කිහිපයක් එදින සභාවේ සිදු වූ අනපේක්ෂිත සිදු වීම නිසා සාකච්ඡා කිරීමට නොහැකි වූ බවත්, කලකදී වීරකම් සේ සිතා කරන බොහෝ දෑ කලකදී ගොන්කම් සේ හැගී යන බවත් පවසා සිටින ලදී.

● මෙහිදී 2018.04.05 සභා වාරයේදි සිදුවූ අතපසුවීම් කිහිපයක් පිළිබඳව ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා කරුණු පෙන්වා දෙමින් එය සකස් කර ගන්නා ලෙසට අවශ්‍ය උපදෙස් ලබා දුනි.

1. සභාපතිට රු.500,000 ක් දක්වා වියදම් අනුමත කිරීමේ බලය ලබාදීම යෝජනාව යටතේ එම යෝජනාව ඉදිරිපත් කලද එය ස්ථිර වීමක් සිදු වී නොමැති බවත්,
2. මෙම යෝජනාව ඉදිරිපත් කර ඇත්තේ නගර සභා කුමන ආඥා පනතේ කුමන වගන්තියේද යන්න සඳහන් කර නොමැති බවත්,

3. න්‍යාය පත්‍රයේ එම යෝජනා ඇතුළත් කිරීමේදි විධිමත් ක්‍රමය අනුව සිදුකල නොමැති බවත්,

4. මෙම යෝජනාවට විරුද්ධ වීමේදි බෙදීමක් යෝජනා කල අවස්ථාවේ එම යෝජනාව ස්ථිර වීමක් සිදු කල නොමැති බවත් මෙහිදී පෙන්වා දුන් අතර එම වැරදි ඉදිරියේදි නිවැරදි කරගන්නා ලෙස පවසා සිටින ලදී.

●එමෙන්ම රටේ පවතින වර්තමාන දේශපාලන තත්වය පිළිබඳව හා නගර සභාවේ පැවති පැරණි දේශපාලන තත්වය පිළිබඳ කරුණු පවසා සිටි අතර ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා රට හා ජාතිය ගැන හැඟීමෙන් අවංකව හා ආසාවෙන් මෙම දේශපාලනයේ යෙදෙන බවත් පවසා සිටින ලදී.

● තව දුරටත් අදහස් දක්වමින් තම කණ්ඩායමේ සංවර්ධන යෝජනා සඳහා සභාවෙන් ලැබිය යුතු අවධානය ලබානොදීම පිළිබඳ බෙහෙවින් කණගාටුවට පත්වෙන බවත්, අදාළ කොට්ඨාශායේ සංවර්ධන කටයුතු සඳහා කොට්ඨාශයේ මන්ත්‍රීවරයා සහභාගි කොට ගෙන එම අවශ්‍ය සහාය ලබාදීමට කටයුතු කරන ලෙස පවසා සිටි අතර, අභාව්‍යප්‍රාප්ත හිටපු සභාපති විමළසේන වැවේගෙදර මැතිතුමා වෙනුවෙන් පවුලේ සියළු දෙනාට ශෝකය ප්‍රකාශ කරන බව පවසා සිටින ලදී.

**● ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමන් විසින් මෙහිදී රටේ පවතින අස්ථාවර දේශපාලන තත්වය පිළිබඳවත් ඊට හේතු සාධක වූ කරුණු කාරණා පිළිබඳවත් තම අදහස් ප්‍රකාශ කරන ලදී.

**● ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා**

● ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් අභාව්‍යප්‍රාප්ත හිටපු සභාපති විමළසේන වැවේගෙදර මැතිතුමන්ට හා ගරු නාගරික මන්ත්‍රීනි පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමයගේ පියාගේ අභාවය වෙනුවෙන් ශෝකය පල කිරීමට මෙය අවස්ථාවත් කර ගන්නා බව පවසා සිටි අතර අභාව්‍යප්‍රාප්ත හිටපු සභාපති විමළසේන වැවේගෙදර මැතිතුමන්ගේ අගනා දේශපාලන ගමන පිළිබඳව ගරු සභාව දැනුවත් කරමින් අදහස් ප්‍රකාශ කරන ලද අතර එතුමාගේ ඉවසීමේ ගුණය අනුගමනය කරන මෙන් වර්තමාන සභාපතිතුමන්ට පවසා සිටින ලදී.

- එමෙන්ම රටේ පවතින දේශපාලන තත්වයත් සභාවේ ඒ පිළිබඳව සාකච්ඡා කල කරුණු පිළිබදවත් අදහස් දක්වා සිටි ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා තම පක්ෂයේ නායකතුමා ඇතුළු එතුමන්ගේ පවුලේ සාමාජිකයන් විසින් රටට සිදුකල වටිනා මෙහෙවර පිළිබඳ කරුණු ඉදිරිපත් කරන ලදී.

**<u>● ගරු නාගරික මන්ත්‍රී එම්.ශාන්තිලේඛා මැතිතුමිය</u>**

- ගරු නාගරික මන්ත්‍රී එම්.ශාන්තිලේඛා මැතිතුමිය අදහස් දක්වමින් අභාව්‍යප්‍රාප්ත හිටපු සභාපති විමළසේන වැවේගෙදර මැතිතුමන්ට හා ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමයගේ පියාගේ අභාවය වෙනුවෙන් ශෝකය පල කර සිටින ලදී.
- එමෙන්ම දේශපාලන බෙදීම නිසා සභාවේ කටයුතු සාර්ථකව සිදු කරගෙන යාමට අපහසු වන අතර තමාද විශාල වශයෙන් පීඩාවට ලක්වී ඇති ගරු මන්ත්‍රී එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් පවසා සිටින ලදී.
- කුමාරගම සරත් මහතාගේ නිවස අසල සිට පන්සල දක්වා නිවාස 60 කට පමණ ජලය නැතිකම නිසා ඇතිවී ඇති ගැටළුකාරී තත්වය පිළිබඳව ගරු සභාවේ අවධානය යොමුකරන ලෙසත්, කුමාරගම රූමි මහතාගේ නිවස අසළට කසල ට්‍රැක්ටරය ධාවනය නොවීම සම්බන්ධයෙන් කරුනු සොයා බලන ලෙසත් මෙහිදී පවසා සිටින ලදී.

**09. අවසානය**

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් ජාතික දේශපාලනය පිළිබදව විවිධ අදහස් පලවූ බවත් තමන් සෑම විටම පොදු මතයක සිට සියළු අදහස්වලින් වටිනා අදහස් ලබාගෙන අනෙකුත් අදහස් බැහැර කරන බවත් පවසා සිටින අතර රටේ ඇති වූ දේශපාලන අස්ථාවර බාවයත් සමග බලංගොඩ නගරයේ ඇතිවූ හා ඇතිවීමට ගිය සිද්ධීන් පිළිබද ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන්ව දැනුවත් කල අවස්ථාවේදි එතුමා ඉතා සහයෝගයෙන් එම ක්‍රියාවන් පාලනය කර ගැනීමට සහය දැක්වූ බවත් ඒ සඳහා ස්තුති කිරීටම මෙය අවස්ථාවක් කරගන්නා බවත් පවසා සිටින ලදී.

පසුගිය දිනෙක නගර සභා ට්‍රැක්ටර් රථ රියදුරෙකුට පහර දීමක් සිදුවූ අතර රෝහල් ගත කරන ලද එම සේවකයාට කිසිදු සාධාරණයක් නොවන පරිදි සැකකරු සම්බන්ධයෙන් පොලිසිය ආසාධාරණ ලෙස ක්‍රියාකිරීම හෙළාදකින බවත් එවන් අවස්ථාවල පක්ෂ පාට භේද නොසළකා ආයතන හැඟීමෙන් ක්‍රියාකරන ලෙසත් ගරු සභාවේ මන්ත්‍රිවරුන්ගෙන් ඉල්ලා සිටින ලදී.

ජනාවට ආදරයෙන් හා වැඩදායි ලෙස දේශපාලනය කලාවක් සේ සලකා හික්මීමෙන් හා ගෞරවය ආරක්ෂා වන පරිදි සභාවේ ඉදිරි කටයුතු සිදුකිරීමට අදිටන් ගන්නා ලෙස ගරු සභාවට ඇරයුම් කල ගරු සභාපතිතුමන් ප.ව.3.00 පමණ සභාවේ කටයුතු අවසන් කරන ල**දී.**

**චමික ජයමිණි විමළසේන,**
**සභාපති,**
**බලංගොඩ නගර සභාව.**